අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/20

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.01. 01

සියලු ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>ගුරුභවතුන්ගේ වෘත්තීය සමාලෝචනය ක්‍රියාත්මක කිරීම.</u>**

අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2.3. වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත 2024.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කරන ලද ගුරුභවතුන්ගේ වෘත්තීය සමාලෝචනය සම්පූර්ණ කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ඇතුළත් අංක 50/2023 හා 2023.12.29 දිනැති අධ්‍යාපන චක්‍රලේඛය මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

03. තව ද, 2022.10.22 දින සිට 2024.01.01 දින දක්වා උසස්වීම් යෙදෙන ගුරුභවතුන් සඳහා වෘත්තීය සමාලෝචනය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමටත්, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය තුළ වෘත්තීය සමාලෝචනය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන්ට උසස්වීම් දිනට පසුව වෘත්තීය සමාලෝචනය සම්පූර්ණ කිරීමට සිදු වුවහොත් ඒ සඳහා සහන කාලයක් ලබා දෙන ලෙසත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්/ අනුමැතිය ලද වහාම ඒ සම්බන්ධයෙන් සියළු පළාත් බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

04. එමෙන්ම, 2024.01.01 දින සිට වසරක් තුළ උසස්වීම් යෙදෙන ගුරුභවතුන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් වෘත්තීය සමාලෝචනය පැවැත්වීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය
අතිරේක ලේකම්(ආයතන)

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/20
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.12. 29

අධ්‍යාපන චක්‍රලේඛ අංක - 50/2023

සියලු ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>ගුරුභවතුන්ගේ වෘත්තීය සමාලෝචනය ක්‍රියාත්මක කිරීම.</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 15 වන වගන්තියේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/7/2/1(II)/2012 සහ 2018.03.28, 2020.02.20, 2020.11.11 හා 2021.10.06 දිනැති ලිපිවලින් 2022.10.22 දක්වා දීර්ඝ කරන ලදී. එදිනෙන් පසු ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් සිදු කිරීම සඳහා උක්ත සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි වෘත්තීය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

2. ඒ අනුව, ඉහත කී ව්‍යවස්ථාවේ 11.2.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව "ශ්‍රී ලංකා ගුරු සේවයේ වෘත්තීය සමාලෝචනය ක්‍රියාත්මක කිරීම" සම්බන්ධයෙන් වන උපදෙස් මේ සමඟ නිකුත් කරමි. මෙම උපදෙස් 2024.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

3. ගුරුභවතුන්ගේ වෘත්තීය සමාලෝචනය සම්බන්ධයෙන් පළාත් මට්ටමින්/ කලාප මට්ටමින් මෙතෙක් ක්‍රියාත්මකව තිබූ කිසියම් විධිවිධානයක් වේ නම් එකී විධිවිධාන මෙම උපදෙස් ක්‍රියාත්මක වන 2024.01.01 දින සිට, මෙතෙක් ගෙන ඇති කිසිදු තීරණයකට අගතියක් නොවන පරිදි අවලංගු කළ යුතු ය.

4. වෘත්තීය සමාලෝචනය ක්‍රියාත්මක කිරීම.

4.1. වෘත්තීය සමාලෝචනය කළ යුතු අවස්ථා ගණන සහ කාලය නිර්ණය කිරීම.

4.1.1. මෙම විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට ගුරුභවතාගේ උසස්වීම ලැබීමට නියමිත දිනට ඉතිරිව ඇති කාලය වසර 01ක් හෝ ඊට අඩු නම් එක් වතාවක් ද, වසර 01 සිට 02 දක්වා කාලයක් නම් දෙවතාවක් ද, වසර 02ට වැඩි නම් තුන් වතාවක් ද, වෘත්තීය සමාලෝචනය සිදු කළ යුතු ය. මීළඟ උසස්වීම සඳහා ඉතිරිව ඇති කාලය වසර 03ට වැඩි නම්, එම කාලයෙන් පළමු 1/3ක කාලය තුළ එක් වතාවක් ද, දෙවන 1/3ක කාලය තුළ එක් වතාවක් ද සහ අවසන් 1/3ක කාලය තුළ තවත් එක් වතාවක් ද වශයෙන් තුන් වතාවක් වෘත්තීය සමාලෝචනය සිදු කළ යුතු ය.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

| වෘත්තීය සමාලෝචනය සඳහා ඉතිරිව ඇති කාලය | වෘත්තීය සමාලෝචනය සඳහා පෙනී සිටිය යුතු වාර ගණන |
|---|---|
| වසර 1 හෝ ඊට අඩු | 01 |
| වසර 1 සිට 2 දක්වා | 02 |
| වසර 2 හෝ ඊට වැඩි | 03 |

4.2. වෘත්තීය සමාලෝචනය සඳහා ඉල්ලුම් කිරීම.

4.2.1. ඉහත 4.1හි පරිදි වෘත්තීය සමාලෝචනය සම්පූර්ණ කළ යුතු සෑම ගුරුභවතෙකුම මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01හි දක්වා ඇති "ගුරු වෘත්තීය සමාලෝචනය සඳහා අයදුම්පත්‍රය" නිවැරදිව පුරවා තමන් සේවය කරන පාසලේ විදුහල්පති වෙත භාර දිය යුතුය.

4.2.2. ඒ අනුව, ඊළඟ වසරේ උසස්වීම් ලැබීමට නියමිත ගුරුභවතුන් විසින් පෙර වසරේ ජූනි 30 දිනට පෙර තම අයදුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

4.2.3. කිසියම් ගුරුභවතෙකු ඉහත "ගුරු වෘත්තීය සමාලෝචනය සඳහා අයදුම්පත්‍රය" ප්‍රමාද වී භාරදෙන කල්හි, එකී ප්‍රමාදයට හේතුව සාධාරණ යැයි විදුහල්පතිවරයා සෑහීමකට පත්වන්නේ නම් හා එකී වෘත්තීය සමාලෝචනය සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් ඉතිරිව ඇති බව විදුහල්පතිවරයා නිගමනය කරන්නේ නම් එම අයදුම්පත භාරගෙන අදාළ ගුරුභවතා නොපමාව වෘත්තීය සමාලෝචනයට යොමු කළ යුතු ය.

4.3. වෘත්තීය සමාලෝචන අයදුම්පත්‍රය ලැබුණු බව තහවුරු කිරීම සඳහා එම අයදුම්පත්‍රයෙහි ඇමුණුම 01හි "ආ" කොටස පුරවා අදාළ ගුරුභවතාට ලබා දිය යුතු ය.

4.4. අධීක්ෂණ කණ්ඩායම පත් කිරීම.

4.4.1. වෘත්තීය සමාලෝචනය සිදු කිරීම සඳහා අධීක්ෂණ කණ්ඩායම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි 11.2.3 හා 13.6 වගන්තියෙහි විධිවිධාන අනුව පත් කළ යුතු වේ.

4.4.2. පාසලේ විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති සමඟ අදාළ විෂය සම්බන්ධයෙන් ගුරු උපදේශකවරයෙකු හා විෂය පිළිබඳ නිපුණතා සහිත වෙනත් පාසලක සේවය කරන ශ්‍රී ලංකා ගුරු සේවයේ පළමුවන පන්තියේ ජ්‍යෙෂ්ඨ ගුරුභවතෙකු සහිත ත්‍රිපුද්ගල අධීක්ෂණ කණ්ඩායමක් පත් කළ යුතු ය.

4.4.3. අධීක්ෂණ කණ්ඩායමක සාමාජිකයෙකු ලෙස පත් කරන ශ්‍රී ලංකා ගුරු සේවයේ පළමුවන පන්තියේ ජ්‍යෙෂ්ඨ ගුරුභවතා සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත පත් කර ගත යුතු ය.

4.4.4. එක් එක් ගුරුභවතා වෘත්තීය සමාලෝචනයට ලක් කිරීම සඳහා වෘත්තීය සමාලෝචන මණ්ඩලය විෂයානුබද්ධව පත් කළ යුතු ය.

4.4.5. සෑම විදුහල්පතිවරයෙකු විසින්ම ඉදිරි වසරට අදාළ පාසලේ වෘත්තීය සමාලෝචන අවශ්‍යතා පිළිබඳ සියලු තොරතුරු මෙහි ඇමුණුම 02 අනුව සකස් කර, පවත්නා වසරේ දෙසැම්බර් 31 දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර, අධීක්ෂණ කණ්ඩායම සඳහා කලාප නියෝජිතයින් (විෂයට අදාළ ගුරු උපදේශක) පත් කිරීමට ඉල්ලීම් කළ යුතු ය.

4.4.6. කිසියම් අධ්‍යාපන කලාපයක කිසියම් විෂයක් සම්බන්ධයෙන් ගුරු උපදේශකවරයෙක් නොසිටින විට දී, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුදැනුම මත සුදුසු අයෙකු ඒ සඳහා පත් කිරීමේ බලය කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියා වෙත ඇත්තේ ය.

4.5. වෘත්තීය සමාලෝචනය පැවැත්වීම.

4.5.1. ගුරුවරයා විසින් දී ඇති තොරතුරු නිවැරදි බව සනාථ කරගත් පසු විදුහල්පති වෙත ඉදිරිපත් වන සියලුම වෘත්තීය සමාලෝචන අයදුම්පත් උසස්වීම් දිනය මත පදනම්ව ප්‍රමුඛතා ලේඛනගත කළ යුතු ය.

4.5.2. ගුරුවරයා වෘත්තීය සමාලෝචනයට ලක් කිරීම සඳහා ඉහත 4.4 වගන්තියෙහි විධිවිධාන අනුව අධීක්ෂණ කණ්ඩායම නම් කළ යුතු ය.

4.5.3. වෘත්තීය සමාලෝචනය සඳහා ඉල්ලුම් කර ඇති සියලුම ගුරුභවතුන් සඳහා අධීක්ෂණ කණ්ඩායම් නම් කළ පසු, කලාප කාර්යාල වලින් ගෙන්වාගත යුතු පිරිස ගෙන්වා ගැනීමටත්, වෘත්තීය සමාලෝචනය පැවැත්වීම සඳහා සුදුසු දින නිර්ණය කිරීමටත් කටයුතු කළ යුතු ය.

4.5.4. කලාප කාර්යාල වලින් ගෙන්වාගත යුතු පිරිස ලබා දිය හැකි දිනය ලද වහාම, එක් එක් ගුරුවරුයාගේ වෘත්තීය සමාලෝචනය පැවත්වෙන දිනය, ස්ථානය, වේලාව ඇතුළත් ඇමුණුම 03න් දක්වා ඇති ආකාරයේ දැන්වීමක් කර එම දැන්වීම ලද බවට ගුරුභවතුන් ලවා අත්සන් ගත යුතු ය.

4.5.5. ඒ අනුව නියම කළ දින නියම කරගත් වෙලාවට වෘත්තීය සමාලෝචනය පැවැත්විය යුතු ය. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා එදිනට පැවත්විය නොහැකිනම් පැවත්විය හැකි ආසන්නතම දිනයේ දී එය පැවැත්විය යුතු ය.

4.6. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය.

4.6.1. ගුරු වෘත්තීය සමාලෝචනයේ දී ගුරුභවතා විසින් තොරතුරු තහවුරු කිරීම සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි 11.2.3හි (අ) අනුව සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4.6.2. ඇමුණුම 04හි දක්වා ඇති වෘත්තීය සමාලෝචනයේදී ඇගයෙන නිපුණතා මට්ටම් හොඳින් අධ්‍යයනය කර, දක්වා ඇති දර්ශක භාවිත කළ යුතු ය. එම නිර්ණායක තමා විසින් සපුරා ඇති බව ඔප්පු කිරීමට තමා හමුවේ ඇති ඕනෑම ආකාරයක සාක්ෂි ඉහත 4.6.1හි පරිදි ඉදිරිපත් කිරීමේ හැකියාව ගුරුභවතුන්ට පවතී.

4.6.3. ඒ අනුව, වෘත්තීය සමාලෝචනයේ දී උපයාගන්නා ලකුණු අනුව පහත සඳහන් ඇගයීම් තත්ත්වය ගුරුවරයාට හිමි වේ.

| | | |
|---|---|---|
| ලකුණු 81ට වැඩි | - | ඉතා හොඳයි |
| ලකුණු 61-80 | - | හොඳයි |
| ලකුණු 40-60 | - | සතුටුදායකයි |
| ලකුණු 40ට අඩු | - | අසතුටුදායකයි |

4.6.4. වෘත්තීය සමාලෝචනයේ එක් එක් අංගය වෙනුවෙන් පිරිනැමෙන ලකුණු ඇමුණුම 04හි ඇති ආකෘතියේ සටහන් කළ යුතු ය.

4.7. වෘත්තීය සමාලෝචනය අවසන් කිරීම.

4.7.1. සෑම වෘත්තීය සමාලෝචනයක් අවසානයේදී ම ඇමුණුම 05හි ආකෘතිය පරිදි සකස් කළ ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකය හා ඇමුණුම 04හි ආකෘතිය පරිදි සකස් කළ ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාව මුල් පිටපත් 03කින් යුක්තව නිකුත් කළ යුතු අතර අධීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයින් එහි අත්සන් තැබිය යුතු ය. ඇගයීම සම්බන්ධව එකඟ වූ/ එකඟ නොවූ බවට ගුරුභවතා විසින් ද අත්සන් තැබිය යුතු ය.

4.7.2. නියමිත පරිදි අත්සන් කරන ලද ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකයෙහි සහ ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාවෙහි පිටපත් පහත පරිදි යොමු කළ යුතු ය.

පිටපත 01 - ගුරුභවතා වෙත ලබා දිය යුතු පිටපත
පිටපත 02 - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු පිටපත
පිටපත 03 - විදුහල්පති විසින් නඩත්තු කළ යුතු පිටපත

4.8. වෘත්තීය සමාලෝචන ඇගයීම සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් ගත යුතු පියවර

4.8.1. කිසියම් ගුරුභවතෙකුට ලැබෙන ඇගයීම සම්බන්ධයෙන් ගුරුභවතා සෑහීමකට පත් නොවන්නේ නම් නැවත වෘත්තීය සමාලෝචනය සිදු කරන ලෙස ඉල්ලා මෙම චක්‍රලේඛයේ ඇමුණුම 06හි දක්වා ඇති ආකාරයේ ලිඛිත අභියාචනයක්, වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකය හා ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාවෙහි පිටපත තමා වෙත ලැබුනු දින සිට දින 14ක් ඇතුළත තමා සේවය කරන පාසලෙහි විදුහල්පතිට පිටපතක් සහිතව අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. දින 14ක් ඇතුළත ඉදිරිපත් නොවන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.8.2. එහි දී, ගුරුභවතා විසින් ඉදිරිපත් කරන කරුණු සත්‍ය, සාධාරණ හා පිළිගත හැකි බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ප්‍රත්‍යක්ෂ වන්නේ නම් එම ගුරුවරයා නැවත වරක් වෘත්තීය සමාලෝචනයට ලක් කිරීමට අධීක්ෂණ කණ්ඩායමට නියෝග කිරීමේ බලය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඇත්තේ ය.

4.8.3. එවන් අභියාචනයක් තමා වෙත ලැබුණු දින සිට දින 21ක් ඇතුළත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඒ සම්බන්ධ තම නියෝගය අදාළ විදුහල්පතිවරයා වෙත දැන්විය යුතු අතර එහි පිටපතක් අදාළ ගුරුභවතා වෙත ද යොමු කළ යුතු වේ. (ඇමුණුම 07)

4.8.4. එම නියෝගය අනුව ඉදිරියේ දී පැවැත්වෙන පළමු සමාලෝචනයෙහිදී ම අදාළ ගුරුවරයා අධීක්ෂණයට ලක් කිරීමට විදුහල්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

5. සමාලෝචනයට අදාළ තොරතුරු කළමනාකරණය.

5.1. වෘත්තීය සමාලෝචන අයදුම්පත (ඇමුණුම 01), ගුරු වෘත්තීය සමාලෝචනයට කැඳවීමේ ලිපිය (ඇමුණුම 03) ගුරුභවතා වෙත ලබා දුන් බවට වන සාක්ෂි, ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාවෙහි විදුහල්පති විසින් නඩත්තු කළ යුතු පිටපත (ඇමුණුම 04හි 03වන පිටපත) හා වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකය (ඇමුණුම 05හි 03වන පිටපත) වෙන වෙනම ගොනුකර තැබීමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු ය.

6. මාරුවීම් ලබන, මුදා හරිනු ලබන හෝ අනුයුක්ත කිරීම් ලබන ගුරුභවතුන්ගේ වෘත්තීය සමාලෝචනය.

6.1. වෘත්තීය සමාලෝචනය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ දිනයත් වෘත්තීය සමාලෝචනය පැවැත්වීමට නියමිත දිනයත් අතර, මාරුවීම් ලබන හෝ මුදා හරිනු ලබන ගුරුභවතුන් සඳහා දැනට සේවය කරන පාසලේ විදුහල්පතිවරයා විසින් වෘත්තීය සමාලෝචනය පැවැත්විය යුතු ය.

7. වෘත්තීය සමාලෝචනයට අදාළව ගුරුභවතුන්ගේ කාර්යභාරය

7.1. සෑම ගුරුභවතෙකුම මෙම චක්‍රලේඛයේ විධිවිධාන හා ඉහත කී ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන හොඳින් කියවා අවබෝධ කරගෙන තම වෘත්තීය අභිවෘද්ධිය තකා නිසි කලට වේලාවට අවශ්‍ය පියවර ගත යුතු ය.

7.1.1. ඉහත කී පරිදි කිසියම් වසරක තමන් වෘත්තීය සමාලෝචනය සඳහා පෙනී සිටිය යුතු නම්, පෙර වසරේ ජූනි 30 දිනට පෙර වෘත්තීය සමාලෝචන අයදුම්පත (ඇමුණුම 01) පුරවා විදුහල්පති වෙත ලබා දිය යුතු ය.

7.1.2. වෘත්තීය සමාලෝචන අයදුම්පත පුරවා විදුහල්පති වෙත ලබා දීමෙන් පසු විදුහල්පති විසින් අත්සන් කරන ලද (ඇමුණුම 01)හි ''ආ'' කොටස නැවත ලබාගෙන සුරක්ෂිතව තබා ගැනීමට ගුරුභවතා විසින් වගබලා ගත යුතු ය.

7.1.3. හැකි සෑම අවස්ථාවකදී ම උපරිම කැපවීමෙන් ඉගැන්වීම් කටයුතු වල යෙදෙන අතර තමාගේ වෘත්තීය අභිවෘද්ධියට දායක විය හැකියැයි පෙනෙන සාධක වල සාක්ෂි එකතු කර තබා ගත යුතු ය.

7.1.4. ගුරුභවතා විසින් තම උසස්වීම සඳහා අයදුම් කිරීමේ දී වෘත්තීය සමාලෝචනය අවසානයේ දී ලබා දෙන වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකයෙහි හා ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාවෙහි විදුහල්පති විසින් සහතික කරන ලද පිටපතක් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ ''ඇ'' පරිශිෂ්ඨය පරිදි සකසනු ලබන අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතු ය.

7.2. විශේෂයෙන්ම වෘත්තීය සමාලෝචනය සඳහා පෙනී සිටීමට ප්‍රථම ඇමුණුම 04 හි ඇතුළත් වෘත්තීය සමාලෝචනයේ දී ඇගයෙන කරුණු හොඳින් අධ්‍යයනය කර අවබෝධ කරගත යුතු ය.

7.3. නියමිත කාලය තුළ වෘත්තීය සමාලෝචනය සඳහා අයදුම් නොකිරීමෙන්, වෘත්තීය සමාලෝචනයට සහභාගී නොවීමෙන් හෝ වෙනත් කිසියම් හේතුවක් නිසාවෙන් නියමිත කාලය තුළ වෘත්තීය සමාලෝචනය අවසන් කිරීමට අපොහොසත් වීමෙන්, එම වෘත්තීය සමාලෝචනය නිම කිරීමට ගුරුභවතාට තිබූ අවස්ථාව අවහිර වන බවත්, එමඟින් තමන්ට ඊළඟ ඉහළ ශ්‍රේණියට/ පන්තියට උසස් වීමට ඇති අවස්ථාව අහිමි/ප්‍රමාද වන බවත් සෑම ගුරුභවතෙකුම අවබෝධ කර ගත යුතු ය. ( වෛද්‍ය වාර්තා මගින් සනාථ කළ හැකි රෝගාබාධවලින් පෙළීම, ගර්භණී තත්ත්වයන්, මාතෘ නිවාඩු ලැබීම ආදිය පමණක් සහන ලබා දීමේදී සළකා බැලිය යුතු ය. )

8. වෘත්තීය සමාලෝචනයට අදාළව විදුහල්පතිවරුන්ගේ කාර්යභාරය.

8.1. වෘත්තීය සමාලෝචනය සඳහා පෙනී සිටීමට ගුරුභවතුන් වෙතින් ලැබෙන වෘත්තීය සමාලෝචන අයදුම්පත සලකා බලා එම ගුරුවරුන් වෙනුවෙන් වෘත්තීය සමාලෝචනය පැවැත්වීම සඳහා ඉහත 4.2 වගන්තියෙහි පරිදි අවශ්‍ය පියවර ගත යුතු ය.

8.2. ප්‍රමාද වී ලැබෙන වෘත්තීය සමාලෝචන අයදුම්පත් සම්බන්ධයෙන් ඉහත 4.2.3 වගන්ති පරිදි කටයුතු කළ යුතු ය.

8.3. වෘත්තීය සමාලෝචනය උපරිම විනිවිදභාවයෙන් යුතුව පැවැත්විය යුතු ය.

9. වෘත්තීය සමාලෝචනයට අදාළව කලාප/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය.

9.1. තම අධ්‍යාපන කලාපයේ/ කොට්ඨාසයේ ගුරුවරුන්ගේ වෘත්තීය සමාලෝචනය සිදු කිරීම අධීක්ෂණය සඳහා සුදුසු ආවේක්ෂණ වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය.

9.2. තම අධ්‍යාපන කලාපයේ/ කොට්ඨාසයේ ගුරුවරුන්ගේ වෘත්තීය සමාලෝචනය පැවැත්වීම සඳහා අවශ්‍ය ගුරු උපදේශකවරු/ කලාප නියෝජිතයන් වෙන්කර දීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් සකස් කළ යුතු ය. ඒ ඒ පාසල් වල වෘත්තීය සමාලෝචනයට පෙනී සිටීමට අපේක්ෂිත ගුරු සංඛ්‍යාව මත පදනම්ව කොට්ඨාස මට්ටමින් ගුරු උපදේශකවරු/ කලාප නියෝජිතයන් බෙදා හැරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

9.3. විදුහල්පතිවරයා විසින් ඇමුණුම 02 පරිදි ගුරු උපදේශකවරු ඉල්ලා සිටි විට තමා හට එම ලිපිය ලැබුණු දින සිට දින 14ක් ඇතුළත විදුහල්පතිවරයා වෙත පිළිතුරු යැවිය යුතු ය.

9.4. මෙම චක්‍රලේඛයේ 4.8 වගන්තියේ පරිදි කිසියම් ගුරුභවතෙකු විසින් වෘත්තීය සමාලෝචනය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන බවට කරනු ලබන අභියාචනා සලකා බලා, ගුරුභවතාගේ ඉල්ලීමෙහි සාධාරණ බවක් ඇති බව නිරීක්ෂණය වන කල්හි ඔබගේ අධීක්ෂණය යටතේ වෘත්තීය සමාලෝචනය නැවත පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

10. ඉහත පාඨ අතර අනුකූලතාවක් නොවේ නම් ඒ සම්බන්ධව හෝ මෙම උපදෙස් වලින් පරිබාහිර යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධ අවසන් තීරණය ලබා දීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

12. මෙම චක්‍රලේඛයේ විධිවිධාන වෘත්තීය සමාලෝචනය සඳහා පමණක් අදාළ වන අතර, කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වූ 2023.10.13 දිනැතිව නිකුත් කරන ලද අංක 31/2023 අධ්‍යාපන චක්‍රලේඛයේ විධිවිධාන සහ මගේ අංක ED/02/29/02/02/06(i) හා 2023.12.13 හා 2023.12.20 දිනැති ලිපි වල විධිවිධාන තවදුරටත් අදාළ වේ.

එම්.එන්. රණසිංහ
ලේකම්

ඇමුණුම 01

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි.

("අ" කොටස)

## ගුරු වෘත්තීය සමාලෝචනය සඳහා අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම -
2. මුලකුරු සමඟ නම -
3. පාසල -
4. මුල් පත්වීමේ දිනය -
5. පත්වීමේ විෂයය -
6. වර්තමාන ශ්‍රේණිය හා පන්තිය -
7. වර්තමාන ශ්‍රේණියට උසස් වූ/ පත්වූ දිනය -
8. ඊළඟ උසස්වීමට අදාළ ශ්‍රේණිය -
9. ඊළඟ උසස්වීමට සුදුසුකම් ලබන දිනය -
10. වෘත්තීය සමාලෝචන වාරය - පළමුවන වාරය/දෙවන වාරය/තුන්වන වාරය

ඉහත නම් සඳහන් මා 20....../......../....... දිනට .................... පන්තියේ .................... ශ්‍රේණියට උසස්විය යුතු දිනය එළඹෙන බැවින් වෘත්තීය සමාලෝචනය සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

.......................................... ..................................

දිනය අත්සන

(වෘත්තීය සමාලෝචනය සිදු කළ යුතු දිනය සනාථ කිරීමට මෙම ලිපිය සමඟ දැනට සිටින ශ්‍රේණියට උසස් කිරීමට අදාළව නිකුත් කළ ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය.)

---

("ආ" කොටස)

............................................................................................................ ගුරුභවතාගේ වෘත්තීය සමාලෝචන අයදුම්පත ලැබුණු බව මින් සහතික කරමි.

විදුහල්පති ..........................................

දිනය හා නිල මුද්‍රාව

ඇමුණුම 02

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

................................කලාපය

**වෘත්තීය සමාලෝචනය සඳහා කාර්ය මණ්ඩලය සපයා ගැනීම.-...........................වර්ෂය**

**........................................................................................................විද්‍යාලය**

අධ්‍යාපන චක්‍රලේඛ 2023/.......... හි.................. වගන්තියෙහි විධිවිධාන පරිදි ගුරුවරුන්ගේ වෘත්තීය සමාලෝචනය පැවැත්වීම සඳහා අවශ්‍ය පහත වගුවේ දක්වා ඇති කාර්ය මණ්ඩල සපයා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

දිනය ..................................................

.............................................

විදුහල්පති
නිල මුද්‍රාව

(අදාල තොරතුරු සැපයීමට දී ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන විට දී ඇමුණුමක් ලෙස භාවිතා කරන්න.)

| අනු අංකය | විෂයය | වෘත්තීය සමාලෝචනයට පෙනී සිටින ගුරුභවතුන් සංඛ්‍යාව | අධීක්ෂණ කණ්ඩායම් ගණන | අවශ්‍ය ගුරු උපදේශකවරු සංඛ්‍යාව | අවශ්‍ය ශ්‍රී.ලං.ගු.සේ.I ශ්‍රේණියේ ගුරුභවතුන් සංඛ්‍යාව | වෘත්තීය සමාලෝචනය පැවැත්වීමට යෝජිත දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

ඇමුණුම 03

..............................................................................ගුරු මහත්මිය/ ගුරු මහත්මා,

ගුරු වෘත්තීය සමාලෝචනය සඳහා කැඳවීම.

ඔබ විසින් .............................................දිනැතිව මා වෙත යොමු කර ඇති අයදුම්පත් සළකා බැලීමෙන් අනතුරුව, වෘත්තීය සමාලෝචනය සඳහා පෙනී සිටීමට ඔබට සුදුසුකම් ඇති බැවින්, ඔබගේ වෘත්තීය සමාලෝචනය....................................................දින පෙ.ව./ප.ව ...................... ට ............................... ........................................................................... දී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව අදාළ තොරතුරු ද රැගෙන එදින නියමිත වේලාවට අදාළ ස්ථානයට වාර්තා කරන මෙන් කාරුණිකව දන්වමි.

..........................................................

විදුහල්පති

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය:.................................................

පිටපත 01/ පිටපත 02/ පිටපත 03
(අදාළ නොවන වචන කපා හරින්න)

## ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් වාර්තාව.

එක් එක් නිපුණතාවයට අදාළව සලකා බැලිය යුතු දර්ශක සවිස්තරාත්මකව පහතින් දක්වා ඇති අතර වෘත්තීය සමාලෝචන ඇගයීම් සිදු කිරීමේ දී අදාළ නිපුණතා මට්ටම සම්පූර්ණ කිරීම අනුව සලකා බලා ලකුණු ලබා දිය යුතු වේ.

| | නිපුණතාව | අසතුටුදායකයි ලකුණු 01 | සතුටුදායකයි ලකුණු 02 | හොඳයි ලකුණු 03 | ඉතා හොඳයි ලකුණු 04 |
|---|---|---|---|---|---|
| **1.0** | **සිසුන් පිළිබඳව හා සිසුන් ඉගෙන ගන්නා ආකාරය පිළිබඳව මනා අවබෝධයකින් යුක්තව කටයුතු කරයි.** | | | | |
| 1.1 | සිසුන්ට බලපාන සමාජ, ආර්ථික, සංස්කෘතික හා භෞතික පරිසරය හඳුනාගෙන කටයුතු කිරීම. | | | | |
| 1.2 | සිසුන්ගේ කායික, මානසික/ බුද්ධිමය හා සමාජීය සංවර්ධන ලක්ෂණ හා පුද්ගල විවිධත්වය හඳුනාගෙන කටයුතු කිරීම. | | | | |
| 1.3 | සිසුන්ගේ ඉගෙනුම් ශෛලීන්, පූර්ව ඉගෙනුම් අත්දැකීම් හා ඉගෙනුම් ගැටලු හඳුනාගනිමින් කටයුතු කිරීම. | | | | |
| 1.4 | සිසුන්ගේ හැකියා, ලැදියා, විභවයතා හා අවශ්‍යතා හඳුනාගනිමින් කටයුතු කිරීම. | | | | |
| **2.0** | **විෂය මාලාව, විෂය නිර්දේශය හා විෂය අන්තර්ගතය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගනියි.** | | | | |
| 2.1 | ජාතික පොදු අරමුණු, පොදු නිපුණතා සාක්ෂාත් වන පරිදි පූර්ණ විෂය මාලාව පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීම. | | | | |
| 2.2 | විෂයෙහි සුවිශේෂී අරමුණු, විෂය නිපුණතා ඉගෙනුම් ඵල සහ විෂය අන්තර්ගතයට අනුකූලව කටයුතු කිරීම. | | | | |
| 2.3 | විෂය අන්තර්ගතයෙහි තිරස් හා සිරස් සම්බන්ධතාවය හඳුනාගනිමින් කටයුතු කිරීම. | | | | |
| **3.0** | **විවිධ ඉගෙනුම් ක්‍රමවේද හා උපායමාර්ග භාවිතා කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වෙයි.** | | | | |
| 3.1 | සිසුන්ගේ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා හඳුනාගනිමින් කටයුතු කිරීම. | | | | |
| 3.2 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උචිත ඉගෙනුම් පරිසරය සකස් කර ගැනීම. | | | | |
| 3.3 | ඉගෙනුම් ද්‍රව්‍ය, ඉගෙනුම් සම්පත් සහ තාක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීම. | | | | |
| 3.4 | 21 වන සියවසට අවශ්‍ය නිපුණතා අත්පත් කර දීම සඳහා විවිධ ඉගෙනුම් අවස්ථා සලසා දීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතා කිරීම. | | | | |
| 3.5 | සිසුන් ස්වයං ඉගනුම(Self- learning) සඳහා යොමු කිරීම. | | | | |
| 3.6 | සිසුන් තුළ 21 වන සියවසට ගැලපෙන පරිදි නිර්මාණශීලී (Creativity) කුසලතා වැඩි දියුණු කිරීම. | | | | |
| 3.7 | සිසුන් තුළ 21 වන සියවසට ගැලපෙන පරිදි විචාරාත්මක චින්තනය (Critical Thinking) වැඩි දියුණු කිරීම. | | | | |
| 3.8 | සිසුන් තුළ සහයෝගීතාව (Collaboration) වැඩි දියුණු කිරීම. | | | | |
| 3.9 | සිසුන් තුළ සන්නිවේදන කුසලතා (Communication skills) වැඩි දියුණු කිරීම. | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.10 | සිසුන්ට සැබෑ ජීවන ඉගනුම් අත්දැකීම් (Real world learning) ලබාදෙන සුතත්‍ය (Authentic) ඉගනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම. | | | | |
| 3.11 | සිසුන්ගේ විභව්‍යතා පුළුල් කිරීම සඳහා විෂය සමගාමී/ වෛකල්පිත/ බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයට අවස්ථා සපයයි. | | | | |
| **4.0** | **සිසු ඉගෙනුම තක්සේරුකරණය හා ඇගයීම, ප්‍රතිපෝෂණය ලබා දීම හා වාර්තාකරණය සිදු කරයි.** | | | | |
| 4.1 | තක්සේරුකරණ හා ඇගයීම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම. | | | | |
| 4.2 | සෑම සිසුවෙකුගේම ඉගෙනුම් ප්‍රගතිය සංවර්ධනය කිරීම සඳහා දත්ත විශ්ලේෂණය සහ භාවිතය සිදු කිරීම. | | | | |
| 4.3 | සිසු ඉගෙනුම් ප්‍රගතිය නියාමනය කිරීම හා ඉගනුම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපෝෂණ (ප්‍රතිකාර්ය සහ ඉදිරිපෝෂණ) ලබා දීම. | | | | |
| 4.4 | ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ස්වයං තක්සේරුව (Self-Assessment) සිදු කිරීම. | | | | |
| 4.5 | සිසුන්ගේ අවශ්‍යතා, ප්‍රගතිය සහ සාධන මට්ටම් පාර්ශවකරුවන් වෙත සන්නිවේදනය කිරීම. | | | | |
| **5.0** | **වෘත්තීය සංවර්ධනය හා වෘත්තීය වටිනාකම්** | | | | |
| 5.1 | වෘත්තීය සංවර්ධනය සඳහා කටයුතු කිරීම. | | | | |
| 5.2 | ගුරුවරයෙකු වශයෙන් ආචාර ධර්ම සහිතව කටයුතු කිරීම. | | | | |
| | මුළු ලකුණු | /100 | | | |
| | මුළු ලකුණු ප්‍රතිශතයක් ලෙස | % | | | |

මුළු ලකුණු අනුව සමස්ත ඇගයීම (√) ලකුණ යොදන්න.

| | | |
|---|---|---|
| ලකුණු 81ට වැඩි | ඉතා හොඳයි | |
| ලකුණු 61-80 | හොඳයි | |
| ලකුණු 40-60 | සතුටුදායකයි | |
| ලකුණු 40ට අඩු | අසතුටුදායකයි | |

අධීක්ෂණ මණ්ඩලය

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

ඇමුණුම 05

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි.

පිටපත 01/ පිටපත 02/ පිටපත 03
(අදාළ නොවන වචන කපා හරින්න)

## ගුරු වෘත්තීය සමාලෝචන ඇගයීම් සහතිකය

1. අධ්‍යාපන කලාපය -
2. කොට්ඨාසය -
3. ගුරුභවතාගේ සම්පූර්ණ නම -
4. පාසල/ විද්‍යාලය -
5. ඇගයීම් අවස්ථාව - (පළමුවන/ දෙවන/ තෙවන)

.................................................දින වෘත්තීය සමාලෝචන මණ්ඩලය මඟින් පවත්වන ලද වෘත්තිය සමාලෝචනයේ දී ඉහත නම් සඳහන් ගුරු මහතා/ මහත්මිය ඉතා හොඳයි/ හොඳයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි යන ඇගයීම් මට්ටමට එළඹි බව මෙයින් සහතික කරමි.

අධීක්ෂණ මණ්ඩලය

| අත්සන | නම | තනතුර |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

6. වෘත්තීය සමාලෝචනය සම්බන්ධයෙන් ගුරුභවතාගේ ප්‍රකාශය.

ඉහත ඇගයීම සම්බන්ධයෙන් එකඟ වෙමි/එකඟ නොවෙමි.

.................................................
ගුරුවරයාගේ අත්සන

නම - .................................................

දිනය - .................................................